**ශීර්ෂය 302 - සමුපකාර සේවක කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**

ශීර්ෂය 302- සමුපකාර සේවක කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 25 දින කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

සමුපකාර සේවක කොමිෂන් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 15.63 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 13.93 ක් උපයෝජනය කර තිබුණි.ඒ අනුව කොමිෂන් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1.70 ක් හෙවත් සියයට 10.88 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි . විස්තර පහත දැක්වේ .

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 14.78 | 13.16 | 1.62 | 10.96 |
| මූලධන | 0.85 | 0.77 | 0.08 | 9.41 |
| එකතුව | 15.63 | 13.93 | 1.70 | 10.88 |

## 2.2 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභාවට අදාළ විෂයය අංක 30201 යටතේ රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 1.00 | 1.00 | 0.30 | 0.65 | 5.00 | 2.02 |

## 2.3 විගණන නිරීක්ෂණය

සමූපකාර කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

--------------------------------------------

### 3.1 විසර්ජන ගිණුම

-----------------

**අයවැය විචලනය**

-----------------

රජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි පූර්ව ඇගයීමකින් ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා නොගැනීම හේතුවෙන් එක් වැය විෂයයක් යටතේ ඇස්තමේන්තුගත මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

### 3.2 කාර්යසාධනය

------------------

2016 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) කොමිෂන් සභාවට ලැබෙන පැමිණිලි හා අභියාචනා සටහන් කරන ලේඛණය නිසි ආකාරයට නඩත්තු නොකිරීම හේතුවෙන් පැමිණිලි හා අභියාචනා සම්බන්ධ ලිපිගොනු හඳුනාගැනීම හා ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු විගණනයට ලබා ගත නොහැකි විය.

(ආ) 2016 වර්ෂය තුලදී අභියාචනා විමර්ශනය හා පැමිණිලි නිරාකරණය කිරීම යටතේ පැමිණිලි හා අභියාචනා 110 ක් සම්බන්ධව කටයුතු කර අදාල විසඳුම් ලබා දීමට සැලසුම් කර තිබුණි. එසේ වුවද, 2016 වර්ෂයේදී කොමිෂන් සභාවට ලද පැමිණිලි හා එයට අදාල ප්‍රගතියද, පසුගිය වර්ෂවල ලද පැමිණිලි සම්බන්ධව ප්‍රගතියද සම්බන්ධ තොරතුරු නොතිබීම හේතුවෙන් සැලසුම්ගත ඉලක්කය කරා කොමිෂන් සභාව ළඟා වී ඇත්දැයි විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(ඇ) සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සමිතියේ සේවකයකු විසින් ඔහුගේ සේවය ස්ථිර කිරීම විධිමත්ව නොකිරීම හා වැටුප් පරිවර්තනයේදී අසාධාරණයක් වීම සම්බන්ධව අවස්ථා 4 කදී කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කර තිබුණි. ඒ පිළිබඳ කොමිෂන් සභාවේ තීරණය 2017 මාර්තු 15 දින සමිතියට දැනුම් දී තිබුණු අතර, සමිතිය ගත් ක්‍රියාමාර්ග 2017 අප්‍රේල් 28 ට පෙර කොමිෂන් සභාවට දැනුම් දෙන ලෙසද දක්වා තිබුණි. එහෙත් 2017 ජුනි 30 දින වන විටත් සමිතිය ගත් ක්‍රියාමාර්ග දැනුම් දී

නොතිබුණු අතර කොමිෂන් සභාව විසින් ඒ සම්බන්ධව පසු විපරම් කිරීමක්ද කර නොතිබුණි.

(ඈ) 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 16 (5) වගන්තිය හා 2011 ජූලි 2 දිනැති අංක 1712/36 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත සමුපකාර සේවක ආයතන සංග්‍රහය අනුව සමුපකාර සමිතියකට සේවකයකු බඳවා ගැනීමේදී කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගැනීම සඳහා පනතේ 1.3.6(4) වගන්තිය යටතේ දැක්වෙන අන්දමට තොරතුරු සකස් කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණි. එසේ වුවද 2016 වර්ෂය තුලදී සමිති 05 ක ස්ථිර සේවකයින් 30 ක් බඳවා ගැනීමේදී හා සමිති 02 ක සේවකයින් 57 ක් උසස් කිරීමේදී ඒ පිළිබඳ තොරතුරු කොමිෂන් සභාවට ඉදිරිපත් කර අදාල අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමුපකාර සේවකයින් සඳහා නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම 2006 වර්ෂයේ යෝජිත ප්‍රධාන කාර්යයක් වුව ද 2017 ජූලි 10 දින තෙක් මෙම කාර්යය ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි.

## 3.3 විසඳා නොතිබුණු විගණන ඡේද

කොමිෂන් සභාවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු පහත සඳහන් විගණන ඡේද සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු නිමකර නොතිබුණි.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2015 | 5 | විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක නොකිරීම. |
| 2015 | 5 | සේවක පුරප්පාඩු නොපිරවීම හා ලේකම් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් නොකිරීම |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 01 | 02 |
| (ii) තෘතියික මට්ටම | 14 | 09 | 05 |
| (iii) ද්විතියික මට්ටම | 06 | 05 | 01 |
| එකතුව | 23 | 15 | 08 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 08 ක් පිරවීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි.

(ආ) සභාවේ ලේකම් තනතුර සඳහා 2016 වර්ෂයේ සිට රේඛීය අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂවරයෙකු වැඩ බැලීම සඳහා පත්කර තිබුණු අතර 2008 වර්ෂයේ සිට මේ දක්වා මෙම තනතුර සඳහා ස්ථිර ලේකම්වරයෙකු පත් කර නොතිබුණි.